# ශ්‍රී ලංකාවට නව මිශ්‍ර මැතිවරණ ක්‍රමයක්: කලාප ක්‍රමය

ජනක රණසිංහසාගර, Ph.D.
සහායක විශේෂඥ
කැලිෆෝර්නියා විශ්ව විද්‍යාලය, අර්වයින්, කැලිෆෝර්නියා, ඇ.එ.ජ.
Email: janakarana@gmail.com

කලාප ක්‍රමය යනු දැනට පවතින දිස්ත්‍රික් සමානුපාතික මැතිවරණ ක්‍රමය ලබාදෙන ප්‍රතිඵලයට ඉතා ආසන්න ප්‍රතිඵල ලබාදෙන බහු ආසන මිශ්‍ර මැතිවරණ ක්‍රමයකි. මෙම ක්‍රමයේ අඩංගු වන ප්‍රධාන කරුණු සාරාංශයක් ලෙස මෙසේ දැක්විය හැක.

1. කලාප ක්‍රමය යනු බහු ආසන අනුපාතික මැතිවරණ ක්‍රමය (DMP) සහ දැනට ලංකාවේ භාවිතා වන සමානුපාතික මැතිවරණ ක්‍රමය උපයෝගී කරගත් මැතිවරණ ක්‍රමයකි
2. මුළු මන්ත්‍රී සංඛ්‍යාව 225 ක් ලෙස නොවෙනස්ව පවතී. මැතිවරණ කොමිසම විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වෙනි ව්‍යවස්ථාව ප්‍රකාරව, නියෝජිතයින් 196 දෙනෙකු එක් එක් දිස්ත්‍රික්ක සඳහා වෙන් කෙරේ. ජාතික ලැයිස්තුව 29 ක් ලෙස නොවෙනස්ව පවතී.
3. යෝජිත ක්‍රමය මගින් සෑම දිස්ත්‍රික්කයක් තුලම නව කලාප යෝජනා කෙරේ. දිස්ත්‍රික්කයක් තුල ස්ථාපනය කරන කලාප සංඛ්‍යාව තීරණය වනුයේ එම දිස්ත්‍රික්කයට නියමිත නියෝජිත සංඛ්‍යාව අනුවය (උප ලේඛන 1 සහ උප ලේඛන 2 බලන්න). සෑම මැතිවරණ දිස්ත්‍රික්කයක් තුලම, දිස්ත්‍රික්කයට නියමිත නියෝජිත සංඛ්‍යාවෙන් අඩකට ආසන්න මැතිවරණ කලාප සංඛ්‍යාවක් ස්ථාපිත කල යුතුය.
4. සෑම නව මැතිවරණ කලාපයක්ම බහු ආසන කොට්ඨාසයකි. එම කලාප ද්විත්ව-සහික කලාප හෝ ත්‍රිත්ව-සහික කලාප වේ. සෑම ද්විත්ව-සහික කලාපයකටම ජනතාවට ඍජුව වග කියන නියෝජිතයින් දෙදෙනෙකුත්, සෑම ත්‍රිත්ව-සහික කලාපයකටම ජනතාවට ඍජුව වග කියන නියෝජිතයින් තිදෙනෙකුත් පාර්ලිමේන්තුවට තේරී පත්වේ.
5. 2020 මැතිවරණයේ දිස්ත්‍රික් නියෝජනය අනුව සලකා බලන විට, නියෝජිතයින් දෙදෙනෙකු පාර්ලිමේන්තුවට තේරී පත්වන ද්විත්ව-සහික කලාප 77 ක්ද, නියෝජිතයින් තිදෙනෙකු පාර්ලිමේන්තුවට තේරී පත්වන ත්‍රිත්ව-සහික කලාප 14ක්ද ලෙස, මුළු ශ්‍රී ලංකාවම නව මැතිවරණ කලාප 91කට බෙදා වෙන් කල හැක (දෙවන උප ලේඛනයේ Table A2 බලන්න).
6. මෙය දිස්ත්‍රික් පදනම් ක්‍රමයකි. කලාප සියල්ල ආවරණය වන ලෙස සැකසූ එක් නාම යෝජනා ලැයිස්තුවක් නාම යෝජනා ලෙස බාර දිය යුතුය. තනි මැතිවරණ කලාපයක් සඳහා නාම යෝජකයින් දෙදෙනෙකුද, බහු මැතිවරණ කලාපයක් සඳහා නාම යෝජකයින් තිදෙනෙකුද නම් කල යුතුය. පක්ෂයකට සියලු කලාප සඳහා හෝ තමන් තෝරා ගත් කලාප කිහිපයක් සඳහා හෝ තරඟ කල හැක. නාම යෝජනා බාර දෙන අවස්ථාවේදී ජාතික ලැයිස්තුව සඳහා 29 දෙනෙකුගෙන් යුත් නාම යෝජනා ලැයිස්තුවක් ද ලබා දිය යුතුය. ජාතික ලැයිස්තුව සඳහා නාම යෝජනා ලබා දීම අනිවාර්ය නැත. ජාතික ලැයිස්තුව සඳහා නාම යෝජනා බාර නොදුනහොත් ජාතික ලැයිස්තුව හරහා ලැබෙන මන්ත්‍රී ධුර සඳහා සුදුසුකම් නොලබනු ඇත.
7. අවම කාන්තා සහ තරුණ නියෝජනය පිලිවෙලින් 25% සහ 20% දක්වා ඉහල දැමෙන ලෙස සැකසූ වගු අංක 2(a) සහ 2(b) සඳහන් ප්‍රකාරව නාම යෝජනා ඉදිරිපත් කලයුතුය. ජාතික ලැයිස්තුවේ කාන්තා නියෝජනය අවම ලෙස 50% වන ලෙසත් තරුණ නියෝජනය අවම ලෙස 20% වන ලෙසත් ජාතික ලැයිස්තු නාම යෝජනා සකස් කර ඉදිරිපත් කලයුතුය. වත්මන් පාර්ලිමේන්තුවේ 60+ (අවුරුදු 61 හෝ ඉහල) නියෝජනය 25% කි. තරුණ සහ මැදි-විය නියෝජනය ඉහල දැමීම සඳහා, 60+ නියෝජනය 19% ට වඩා අඩු වන ලෙස සැකසූ වගු අංක 2(c) සඳහන් ප්‍රකාරව නාම යෝජනා ඉදිරිපත් කලයුතුය. ජාතික ලැයිස්තුවේ 60+ නාම යෝජිතයන් සංඛ්‍යාව උපරිම ලෙස 5 දෙනෙකුට සීමා විය යුතුය.
8. සෑම නාම යෝජකයෙකුම අ.පො.ස. (උ.පෙ.) විෂයයන් 3ක් එක් වරකදී සමත් වී හෝ ඊට සමාන විදේශ විභාගයක් සමත් වී තිබිය යුතුය. මෙම අවම සුදුසුකම පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර දැරූ/දරන නාම යෝජකයන් සඳහා අදාළ වන්නේ නැත. ජාතික ලැයිස්තු නාම යෝජකයන් අවම වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබිය යුතුය.
9. අවසන් නාම යෝජනා දින සිට දින තුනකට පසු මැතිවරණ කොමිසම විසින් මනාප අංක ලබා දෙනු ඇත. ද්විත්ව-සහික කලාප සඳහා තරඟ වදින අපේක්ෂකයන් හට අංක 1 සහ 2 ද, ත්‍රිත්ව-සහික කලාප

සදහා තරඟ වදින අපේක්ෂකයන් හට අංක 1, 2 සහ 3 ද ලබා දෙනු ඇත. ජාතික ලැයිස්තු අපේක්ෂකයන් හට අංක 1 සිට 29 දක්වා මනාප අංක ලබා දෙනු ඇත.

10. ජාතික ලැයිස්තුවේ මනාප අංක හැරුන කොට, නව ඡන්ද පත්‍රිකාව මෙතෙක් පාර්ලිමේන්තු මැතිවරණ සදහා භාවිතා කල ඡන්ද පත්‍රිකාවට බෙහෙවින් සමාන වේ (බලන්න Fig. 2).
11. ඡන්දදායකයින් විසින් ප්‍රථමයෙන් පක්‍ෂයට ඡන්ද සලකුණු කර දෙවනුව එම පක්‍ෂයේ තමන් කැමති අපේක්ෂකයින්ට මනාප සලකුණු කල හැක. ඡන්දදායකයාට තම අභිමතය පරිදි ද්විත්ව-සභික කලාපයකදී නම් උපරිම ලෙස මනාප දෙකක්ද, ත්‍රිත්ව-සභික කලාපයකදී නම් උපරිම ලෙස මනාප තුනක්ද ලබා දීමට හැකියාව ඇත. ඡන්දදායකයාට ජාතික ලයිස්තුවේ අපේක්ෂකයින් තිදෙනෙකුටද මනාප ලබා දිය හැක. ඡන්දදායකයාට අවශ්‍යනම් පක්‍ෂයට පමණක් ඡන්දය ලබාදී, අපේක්ෂකයින්ට මනාප සලකුණු නොකර සිටිය හැක.
12. දැනට පවතින ක්‍රමයේදී එකම පක්ෂයේ අපේක්ෂකයින් 7 -22 අතර ප්‍රමාණයක් මනාප සදහා පොර කන අතර, නව කලාප ක්‍රමය නිසා මනාප පොරය ද්විත්ව-සභික කලාපයක අපේක්ෂකයින් දෙදෙනෙකුටද, ත්‍රිත්ව-සභික කලාපයක අපේක්ෂකයින් තිදෙන කුටද පමණක් සීමා වේ. ඡන්දදායකයාට එකම පක්ෂයේ සියලු අපේක්ෂකයින්ට මනාප ලබා දීමට හැකි නිසා මනාප පොරය නැති වී යාමටද ඉඩ ඇත.
13. මෙම ඡන්ද ක්‍රමයේ ගණනය කිරීම විස්තර කිරීම සදහා පහත සදහන් නාමකරණය භාවිතා කෙරේ. ද්විත්ව-සභික කලාප සදහා ඇති ආසන දෙක පළමු-සභික ආසනය සහ දෙවන-සභික ආසනය ලෙසද, ත්‍රිත්ව-සභික කලාප සදහා ඇති ආසන තුන පළමු-සභික ආසනය, දෙවන-සභික ආසනය සහ තෙවන-සභික ආසනය ලෙසද නම් යොදා ගැනේ.
14. ඕනෑම කලාපයක (ද්විත්ව-සභික කලාප හෝ ත්‍රිත්ව-සභික කලාපයක), වැඩිම ඡන්ද ලබාගත් පක්ෂයට, එම කලාපයේ පළමු-සභික ආසනය හිමි වේ. එම පක්ෂය කලාපයේ ජයග්‍රාහි පක්ෂය ලෙස සැලකේ. ත්‍රිත්ව-සභික කලාපයක, දෙවනුවට වැඩිම ඡන්ද ලබාගත් පක්ෂය, බාදක ඡන්ද සංඛ්‍යාවට වඩා ඡන්ද සංඛ්‍යාවක් ලබා ගතහොත් එම කලාපයේ තෙවන-සභික ආසනය හිමි වේ. එසේ නොවුනහොත්, ජයග්‍රාහි පක්ෂයට තෙවන-සභික ආසනය හිමි වේ. බාදක ඡන්ද සංඛ්‍යාව යනු ජයග්‍රාහි පක්ෂය ලබා ගත් ඡන්ද සංඛ්‍යාවෙන් 25% කි.
15. කලාප ඡන්ද එකතු කල පසු දිස්ත්‍රික්කයේ වැඩිම ඡන්ද ලබාගත් පක්ෂයට බෝනස් ආසනය හිමි වේ.
16. කලාප ක්‍රමය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වෙනි ව්‍යවස්ථාවේ දිස්ත්‍රික් සමානුපාතික මැතිවරණ ක්‍රමයම යොදා ගන්නා අතර දිනාගත් කේවල ආසන (පළමු-සභික ආසනය සහ තෙවන-සභික ආසනය) සදහා අඩු කිරීමක් කරනු ඇත.
17. කලාපයේ දෙවන-සභික ආසනය හිමිවනුයේ, එම දිස්ත්‍රික්කයේ බෝනස් හෝ සමානුපාතික ආසන හිමි පක්ෂයකටය. මෙයට අදාළ ගණනය කිරීම 2.9 කොටසේ සදහන්ව ඇත.
18. පක්ෂයකට කලාපයක ආසනයක් හෝ ආසන කිහිපයක් හිමි වූ පසු, එම කලාපයේ පක්ෂය නියෝජනය කරමින් තරඟ කල අපේක්ෂකයන්ගේ මනාප සලකා බලනු ඇත. වැඩිම මනාප ඡන්ද ලබාගත් අපේක්ෂකයාට ප්‍රථමයෙන් ද, ඊළඟ මානප වැඩියෙන් ලබාගත් අපේක්ෂකයා දෙවනුවද ලෙස අවරෝහණ පිළිවෙලට ආසන ඇබර්තු පිරෙන තෙක් නම් කෙරේ.
19. දැනට බෙදා දෙන අකාරයටම, ශ්‍රී ලංකාව තුල ඡන්ද ලබා ගත් අනුපාතයට අනුව ජාතික ලැයිස්තුවේ මන්ත්‍රී ධුර 29 පක්ෂ අතර බෙදා දෙනු ඇත. පක්ෂයකට ජාතික ලැයිස්තු ආසන ලැබුන පසු, ජාතික ලැයිස්තු අපේක්ෂකයින් ලබා ගත් මනාප ඡන්ද ඡන්ද සංඛ්‍යාවේ අවරෝහණ අනුපිලිවෙලට ජාතික ලැයිස්තු ඇබර්තු පිරවිය යුතුය. ජාතික ලැයිස්තුවේ නම් නැති අපේක්ෂකයන්ට පාර්ලිමේන්තුවට තේරී පත් වීමට අවස්ථාව ලැබෙනුයේ, ජාතික ලැයිස්තු අපේක්ෂකයින් 29 ටම අවස්ථාව හිමිවීමෙන් පසුවය. ජාතික ලැයිස්තුවේ අපේක්ෂකයින් අවසන් වූ විට පක්ෂයේ නායක හෝ ලේකම් විසින් ඒ සදහා නියෝජිතයෙක් නම් කල හැකිය.
20. කලාප ආසන පුරප්පාඩුවක් මතුවූ විට, කලාපයේ ඊලග අපේක්ෂකයාට අවස්ථාව හිමිවේ. කලාපයේ තව දුරටත් අපේක්ෂයකයින් නොමැති අවස්ථාවක පක්ෂයේ නායක හෝ ලේකම් විසින් ඒ සදහා නියෝජිතයෙක් නම් කල යුතුය.